# 9 වීර නායකයෝ

මිසරයේ වහල්කමින් මිදී ඉශ්රායෙල් ජනතාව පොරොන්දු දේශයට පැමිණියෝ ය. එම දේශයෙහි පදිංචි වීමෙන් පසු ව ද ඔවුන්ට විවිධ ජාතීන්ගෙන් බොහෝ කරදර, හිරිහැර අමාරුකම් ආදියට මුහුණදීමට සිදු විය. බාහිර ආක්‍රමණවලින් හා බලපෑම්වලින් ඉශ්රායෙල් ජනතාව මුදාගෙන ඔවුන්ගේ ජීවිත සාර්ථක කර ගැනීමට දෙවියන් වහන්සේ වීර නායකයන් පත් කළ සේක. වීර නායකයන් පත් කිරීම ගැන වීරාවලියෙහි මෙසේ සඳහන් කරයි.

> ඉශ්රායෙල් සෙනඟ කොල්ලකෑ අයගෙන් ඔවුන් ගලවා ගන්නා පිණිස ස්වාමීන් වහන්සේ වීර නායකයන් පත් කළ සේක.
>
> (වීරාවලිය 2:16)

වීර නායකයන් සිටි කාලය ක්‍රි.පු. 1200-1050 දක්වා විය. වීර නායකයින්ගේ කාලය පිළිබඳ විස්තර අධ්‍යයනය කිරීමේ දී පෙනී යන එක් කරුණක් නම්, ඔවුන්ගේ නායකත්වය මුළු ඉශ්රායෙල් ජාතිය කෙරෙහි ම නොවූ බව ය. වීර නායකයන්ගේ මූලික කාර්ය වූයේ, ඉශ්රායෙල්වරුන්ට එල්ල වූ යුද්ධවල දී යුද නායකත්වය දෙමින් හා ජුදා ජනතාව එක්සත් කරමින් ජාතියක් වශයෙන් ගොඩනැගීමට අවශ්‍ය පදනම සකස් කිරීමට ක්‍රියා කිරීම ය.

> ස්වාමීන් වහන්සේ ඔවුන්ට වීර නායකයන් පත් කර දුන් විට, උන්වහන්සේ වීර නායකයන් සමග සිට, ඔවුන්ගේ මුළු ජීවිත කාලය තුළ ඉශ්රාලේවරුන් සතුරන්ගේ අතින් ගැළවූ සේක. ඔවුන්ට පීඩා කළා වූ ද ඔවුන් පොඩි කළා වූ ද අය කරණ කොටගෙන හටගත් ඔවුන්ගේ කෙඳිරිගෑම නිසා සමිඳාණන් වහන්සේ ඔවුන්ට අනුකම්පා කළ සේක.
>
> (වීරාවලිය 2:18)

මෙම ප්‍රකාශයෙන් සනාථ වන්නේ යාවේ දෙවියන් වහන්සේ ජුදා ජනතාව ආරක්ෂා කර ගැනීමට වීර නායකයන් පත් කළා පමණක් නොව, ඔවුන් සමග සිටිමින් ජුදා ජනතාවගේ ගැලවීම වෙනුවෙන් කටයුතු කළ බව ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ශුද්ධ බයිබලයේ වීර නායකයන් 12 දෙනෙකු ගැන සඳහන් වේ. ඔවුන්ගේ නම් මෙසේ ය.

| | | |
|---|---|---|
| 1. ඔත්නියෙල් | 5. ගිඩියොන් | 9. ඉබ්ශාන් |
| 2. ඒහුද් | 6. තෝලා | 10. ඒලොන් |
| 3. ෂම්ගර් | 7. ජායීර් | 11. අබ්දොන් |
| 4. දෙබෝරා | 8. ජෙප්තා | 12. සැම්සොන් |

## දෙබෝරා නම් වීර නායිකාව



9.1 රූපය - දෙබෝරා නම් වීර නායිකාව

දෙබෝරා ඉතා නැණවත් කාන්තාවකි. ඇයගේ කාලයේ දී කානානීය රජෙක් ඉශ්රායෙල්වරුන්ට පීඩා කළේ ය. එම පීඩා නිසා ඉශ්රායෙල් ජනතාව දෙවියන් වහන්සේට මොර ගැසූහ. දෙබෝරාගේ උපදෙස් පරිදි බාරාක් විසින් දස දහසක් වූ සේනාවක් කානානීය හමුදාවට විරුද්ධ ව මෙහෙයවන ලදි. බාරාක්, තාබෝර් කන්දට පැමිණි බව දැනගත් කානානීයවරු ඔවුන් හා සටනට සූදානම් වූහ. කානානීය හමුදවට විරුද්ධ ව යුධ වැදීමට ඉශ්රායෙල් හමුදපති බාරාක් ව දෙබෝරා දිරි ගැන්වූවා ය. දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය නිසා ඉශ්රායෙල් හමුදව ජයග්‍රහණය කළේ ය. මේ ජය ඉශ්රායෙල් හමුදවේ ජයග්‍රහණයක් නොවන බවත් එය ලබා දුන්නේ දෙවි ස්වාමීන් වහන්සේ බවත් දෙබෝරා ඔවුනට වටහා දුන්නා ය.

## ගිඩියොන් නම් වීර නායකයා



9.2 රූපය - ගිඩියොන් නම් වීර නායකයා

සතලිස් වසරක සාමකාමී කාලයකින් පසු යළිත් ජුදා වංශය දෙවියන් වහන්සේට විරුද්ධ ව පව් කළ නිසා එයට දඬුවමක් ලෙස ඔවුන්ට මිදියන්වරුන්ගෙන් පීඩා විඳින්නට සිදු විය. ඔවුන්ට සහනය සලසන මෙන් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටියෙන් ඒ සඳහා වීර නායකයකු ලෙස ගිඩියොන් කැඳවනු ලැබී ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සමිඳාණන් වහන්සේගේ දූතයා ඔහුට පෙනී, "ධෛර්යවත්, බලවත් මනුෂ්‍ය ය. සමිඳාණන් වහන්සේ ඔබ සමග සිටින සේක"යි කී ය.

සමිඳාණන් වහන්සේ ඔහු දෙස බලා, "නුඹට ඇති බලසම්පන්නකම මෙහෙයවා, මිදියන්වරුන් අතින් ඉශ්රායෙල්වරුන් ගලවන්න. නුඹ යවන්නේ මම ය"යි වදාළ සේක.

(වීරාවලිය 6:12, 6:14)

ගිඩියොන් ද ඉශ්රායෙල්වරුන් බොරු දෙවිවරුන්ට තනා තිබුණු සියලු පූජාසන විනාශ කොට යුද්ධයට යාමට සේනා රැස් කළේ ය. එහෙත් දෙවියන් වහන්සේගේ නියමය පරිදි සිය යුද්ධ හමුදාව 300කට සීමා කළේ ය. ගිඩියොන්ගේ උපදෙස් පරිදි සෙබළුන් සියලු දෙනා මිදියන් කඳවුර වෙත ගොස් පන්දම් දමා ගෙන ගිය කළගෙඩි බිඳ දමා හොරණෑ පිම්බෝ ය. කලබලයකට පත් මිදියන් සේනාව එකිනෙකා තම තමන්ගේ කඩු ඇඳ ඔවුන් එකිනෙකා මරා ගත්හ.

## සාමුවෙල් නම් විනිශ්චයකාරවරයා



9.3 රූපය - සාමුවෙල් නම් විනිශ්චයකාරවරයා



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සාමුවෙල් ජීවිතාන්තය දක්වා ඉශ්රායෙල්වරුන් විනිශ්චය කළේ ය. ඔහු වසරක් පාසා වසරක් බෙතෙල්ටත්, ගිල්ගාල්ටත් මිශ්පාටත් පිළිවෙළින් ගොස් ඒ ඒ ස්ථානවල දී ඉශ්රායෙල්වරුන් විනිශ්චය කළේ ය. ඉන්පසු ඔහු රාමා නගරයට ගියේ ය. මන්ද ඔහුගේ ගෙය තිබුණේ එහි බැවිනි. එහි දී ද ඔහු ඉශ්රායෙල්වරුන් විනිශ්චය කළේ ය. තව ද ඔහු එහි සමිඳාණන් වහන්සේට පූජාසනයක් ගොඩ නැගුවේ ය.

(1 සාමුවෙල් 7:15-17)

- ★ සාමුවෙල් අවසාන විනිශ්චයකාරයා ය.
- ★ දිවැසිවරයෙකි.
- ★ සාමුවෙල් පූජකයෙකි.
- ★ සාමුවෙල්, සාවුල් හා දාවිත් රජකමට අභිෂේක කළේ ය.



9.4 රූපය - සාමුවෙල්, සාවුල් අභිෂේක කිරීම



9.5 රූපය - සාමුවෙල්, දාවිත් අභිෂේක කිරීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

වීර නායකයන්ගේ අපට ගත හැකි ආදර්ශ

- ★ අන් අයගේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම.
- ★ අන් අය මුහුණදෙන ගැටලුවල දී උදවු කිරීම.
- ★ ප්‍රශ්න හා ගැටලුවල දී වීර නායකයන් මෙන් දෙවියන් වහන්සේට යාච්ඤා කිරීම.
- ★ දෙවියන් වහන්සේ අප සමග සැම විට ම සිටින බව විශ්වාස කිරීම.

**ක්‍රියාකාරකම**



1. වීර නායකයන් දොළොස් දෙනා නම් කරන්න.
2. වීර නායකයන්ගේ මූලික කාර්ය වූයේ කුමක් ද?
3. අන් අයගේ යහපත වෙනුවෙන් පාසල තුළ දී ඔබට කළ හැකි කාර්යයන් තුනක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

*අන් අයගේ යහපත වෙනුවෙන් සැම විට ම කටයුතු කරමු.*